2024.12.09 දිනමිණ පි 3

සංගණන නිලධාරීන්ට ඇතැම් නිවාසවලින් තොරතුරු දෙන්නේ නෑ

සංගණන කටයුතු 23වැනිදා අවසන්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

සංගණන නිලධාරීන්ට ඇතැම් නිවාසවලින් තොරතුරු ලබා නොදීමේ තත්ත්වයක් ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය සඳහන් කළාය. සංගණන කටයුතු සඳහා නිවාස වෙත පැමිණෙන ගණන් ගැනීමේ නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු ලබාදීමට කිසිම බියක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවක් නැති බවත්, සිය නිවසට පැමිණෙන නිලධාරීන්ට තොරතුරු ලබාදෙන ලෙසත් අධ්‍යක්ෂ ජනරාල්වරිය ඉල්ලීමක් කරන්නිය. දැනට සිදුකරන එම සංගණන කටයුතු මේ මස 23 වැනි දිනෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වන බව අධ්‍යක්ෂ ජනරාල්වරිය සඳහන් කළාය.

වැඩිදුරටත් අධ්‍යක්ෂ ජනරාල්වරිය මෙසේද සඳහන් කළාය.

ජන හා නිවාස සංගණනයේ තොරතුරු රැස් කිරීමේ අදියරේ කටයුතු 2024 වසරේ ඔක්තෝබර් මාසයේ 7වැනිදා ආරම්භ වුණා. 2023 වසරේ ඔක්තෝම්බර් මාසේ ආරම්භ කළා සෑම නිවසකට, ගොඩනැඟිල්ලකටම රතු-පාට ලේබලයක් අලවන්න. ඒ ලේබලය පදනම් කර ගනිමින් තමයි නිවාසවල ජීවත්වන පුද්ගලයන්ගේ සහ ඒ නිවාසවල තොරතුරු රැස් කිරීම අප කළේ. මේ තොරතුරු රැස්කිරීම් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන්නේ සංගණන ආඥාපනත යටතේ පැවැරී ඇති බලතල අනුවයි. කිසිම සැකයක් ඇති කරගන්න එපා.කිසිම ආකාරයකින් පෞද්ගලික මිථ්‍යාමේ තීන්දු තීරණ ගැනීමට මේ තොරතුරු භාවිත වෙන්නේ නැහැ.රටේ ඉදිරි අනාගතය‍ට,ඉදිරි වසර 10 සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය‍ට, සැලසුම් සකස් කිරීමට අවශ්‍ය වෙන තොරතුරු තමයි මේ සංගණනයෙන් දෙන්නේ.මේ ගණන් ගැනීමේ අදියරේ කටයුතු මේ මස 23 වැනිදායින් අවසන් කරන්න සියලු කටයුතු සැලසුම් කර තිබෙනවා.මේ මස 19 වැනි දිනය සංගණන දිනය විදිහට ප්‍රකාශයට පත් කර ගැසට් නිවේදනයක් ජනපතිවරයා විසින් නිකුත් කර තිබෙනවා. ඒ අනුව ගණන් ගන්නා නිලධාරියෙක් සංගණනයට තොරතුරු රැස් කිරීමට ගිහේ නිවසට නොපැමිණියොත් 1901 දුරකතන අංකය අමතා දැනුම් දෙන ලෙස සියලු දෙනාම දැනුවත් කරනවා.